00030

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන- 4 වන මට්ටම 2020/2021
අවසාන පරීක්ෂණය
**EPU4232 -** නිවස-පාසල-ප්‍රජාව අතර සම්බන්ධතාවය
කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2023.03.04 වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.11.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරාගත් ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

<u>1 වන කොටස</u>

01. "පවුල-පාසල-ප්‍රජාව අතර සම්බන්ධතාව" යන යෙදුම නිර්වචනය කරන්න.

02. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ගුරුවරුන්, සිසුන්ගේ දෙමාපියන් සහ පවුලේ සාමාජිකයන් සමග සබඳතා පවත්වාගෙන යාමේ දී මුහුණ දෙන ගැටළු පහක් (05) නම් කරන්න.

03. "පවුල-පාසල සම්බන්ධතා රාමුව මාන හතක් හඳුනා ගනියි." ඒවා මොනවා ද?

04. "ළමා සංවර්ධනය පුළුල් ලෙස අංශ තුනකට බෙදා ඇත." ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

05. පවුල හා පාසල අතර සම්බන්ධතාව පවත්වා ගැනීම සඳහා භාවිත කරන උපාය මාර්ග තුනක් (03) ලියන්න.

06. "අද්විතීය පුද්ගලයකු ලෙස ළමයා" මෙම වගන්තියකට පක්ෂව ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න.

07. "දෙමාපියන්ගේ සහභාගිත්වය" (Perant engagement) යනු කුමක්දැයි පැහැදිලි කොට එය දෙමව්පියන් සම්බන්ධවීම යන්නෙහි වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න.

08. පාසල් ක්‍රියාකාරකම් සඳහා දෙමාපියන්ගේ සහභාගිත්වයට ඇති බාධක තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) පවුල-පාසල් සම්බන්ධතාව තුළ දෙමාපියන්ට ගුරුවරුන්ට සහ පාසල්වලට ලබාගත හැකි ප්‍රතිලාභ තුනක් **(03)** බැගින් ලැයිස්තුගත කරන්න. (ලකුණු 08)

(ii) "පවුල-පාසල් සම්බන්ධතාව සිසුන්ගේ ප්‍රගතිය සහ සාර්ථකත්වය කෙරෙහි නැඹුරු විය යුතු ය."

සිසුන්ගේ ප්‍රගතිය සහ සාර්ථකත්වය ළඟා කර ගැනීමට පෙරපාසල් ගුරුවරුන්ට පවුල-පාසල් සම්බන්ධතාව තුළින් භාවිත කළහැකි උපාය මාර්ග තුනක් **(03)** සහ ශිල්පී ක්‍රම තුනක් **(03)** සාකච්ඡා කරන්න. (ලකුණු 12)

10. (i) දරුවන්ගේ පුද්ගලික අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කිරීම වැදගත්වන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) පාසල- පවුල අතර සාර්ථක සහයෝගී සබඳතාවයක් සඳහා මූලික වන විශ්වාසයන් සහ ආකල්ප විස්තර කරන්න. (ලකුණු 10)

11. (i) ඔබ පෙරපාසල් හෝ ප්‍රාථමික පාසල් ගුරුවරයකු යැයි සිතන්න. දෙමාපියන්ට ඔවුන්ගේ දරුවන්ගේ ඉගෙනීමට ඵලදායී ලෙස සම්බන්ධ වීමට සහ නිරතවීමට ඔබ කුමන උපාය මාර්ග භාවිත කරන්නේ ද? විස්තර කරන්න. (ලකුණු 10)

(ii) නිවස -පාසල-ප්‍රජා සබඳතා වැඩිදියුණු කිරීම සඳහා වර්තමානයේ පෙරපාසල් හෝ ප්‍රාථමික පාසල් ආරම්භ කර ඇති වැඩසටහන්/ක්‍රියාකාරකම් තුනක් **(03)** නම් කර නිදසුන් සමඟ ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) ප්‍රාථමික පාසල් පද්ධතියේ වර්තමානයේ ක්‍රියාත්මක වන පාසල- නිවස ප්‍රජා ව්‍යාපෘති ලැයිස්තුගත කරන්න. (ලකුණු 08)

(ii) දරුවන්ගේ ඉගෙනුම් සාධනය වැඩි දියුණු කිරීම සඳහා උපකාර කරගත හැකි ක්‍රියාකාරකම් දෙකක් **(02)** තෝරාගෙන එම ක්‍රියාකාරකම් සඳහා ඔබ දෙමාපියන් සම්බන්ධ කර ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 12)

13. (i) දෙමාපියන් සහ පාසල අතර නිර්මාණාත්මක හා ඵලදායී සන්නිවේදනයක් ඇති කිරීමට සුදුසු ක්‍රම තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ප්‍රාථමික පාසල් ගුරුවරුන් සමඟ සම්බන්ධතා ජාල ගොඩනැගීමේ දී දෙමාපියන් මුහුණ දෙන අභියෝග දෙකක් **(02)** නම් කර ඒවා ජයගත හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

- හිමිකම් ඇවිරිණි. -